**ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව - 2017**

---------------------------------------------------------------------------

ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ පාඩු සහ වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනතේ 22(ඒ)(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් කොමිෂන් සභාවේ සභාපති වෙත 2018 ජූලි 31 දින නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම**

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ .

**1.3 විගණකගේ වගකීම**

-------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත දැක්වෙන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01

ප්‍රමිතයෙහි 99 ඡේදය ප්‍රකාරව ආයතනයක් විසින් වියදම්වල ස්වභාවය අනුව හෝ ආයතනයේ කාර්යයන්ට අදාලවන ආකාරයට එහි වියදම්, මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් කොමිෂන් සභාවේ කාර්යයන්වලට පරිබාහිර කාර්යයන් සඳහා වැය කර තිබුණු රු. 825,000 ක් සභාවේ කටයුතු නියාමනය කිරීමේ වියදම් (Regulatory Expenses) ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16

ප්‍රමිතයේ 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 9,562,937 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ, ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19

(i) ප්‍රමිතයෙහි 57 (ඇ) (III) වගන්තිය අනුව පාරිතෝෂික සඳහා වන ස්ථාවර තැන්පතුවෙහි වර්ෂයට අදාල පොළී ආදායම රු. 5,589,452 ක් විස්තීරණ ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගත යුතු වුවද පාරිතෝෂික වෙන්කිරීමේ ගිණුමට බැර කිරීම හේතුවෙන් පාරිතෝෂික වෙන්කිරීම වැඩියෙන්ද වර්ෂයේ ලාභය අඩුවෙන්ද පෙන්නුම් කර තිබුණි.

(ii) තවද එම ස්ථාවර තැන්පතුවට අදාල පොළී ආදායම එම වත්කමට එකතු කිරීමකින් තොරව කොමිෂන් සභාවේ ආයෝජනවලට එකතුකර පෙන්වා තිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංඛ්‍යාත කළමනාකරණ නඩත්තු මෘදුකාංග (Frequency Management Maintenance Software – FMMS) ව්‍යාපෘතියේ මෘදුකාංග නඩත්තු කිරීම වෙනුවෙන් 2017 නොවැම්බර් 01 සිට 2018 ඔක්තෝබර් 31 දක්වා රු. 21,697,523 ක් 2018 වර්ෂයේදී ගෙවා තිබූ අතර එම සම්පූර්ණ මුදලම සමාලෝචිත වර්ෂයේ වියදම් හා උපචිත වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේවුවද ගෙවූ මුදලින් රු.18,071,362 ක් අදාල වනුයේ 2018 වර්ෂයට වූ බැවින් සමාලෝචිත වර්ෂයේ වියදම් හා උපචිත වියදම් එම අගයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව 2018 වර්ෂයේදී ගෙවන ලද නෙළුම් කුළුණ ව්‍යාපෘතියේ ඉදිකිරීම් සඳහා උපදේශක සේවාවන් ලබාගැනීමේ වියදම් ඇතුළුව එකතුව රු. 4,310,660 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2010 වර්ෂයේ මිලදී ගන්නා ලද රු. 1,795,000 ක් වටිනා වාහනයක් වෙනුවෙන් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ ක්ෂය නිවැරදිව ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට සමුච්චිත ක්ෂය වටිනාකම වාහනයේ පිරිවැය ඉක්මවා රු. 2,855,310 ක් ලෙස දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ මිලදී ගන්නා ලද රු.4,866,987 ක් වටිනා පරිගණක මෘදුකාංග ඒ යටතේ දෙවරක් සටහන් කිරීම නිසා එම අගයෙන් මූල්‍ය ප්‍රකාශනවල පරිගණක මෘදුකාංග වටිනාකම වැඩියෙන් දක්වා තිබුණ අතර ඊට අදාල බැර සටහන කාර්යාල උපකරණ අළුත්වැඩියා හා නඩත්තු වියදම් ගිණුමෙන් අඩුකර දක්වා තිබුණි. එම නිසා සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය ද රු.4,866,987 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබුණි.

## 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල බදු ගෙවීමේ උපලේඛන අනුව ජාතිය ගොඩනැගීමේ බදු සහ ආර්ථික සේවා ගාස්තුවලට යටත් පිරිවැටුම, රු. 20,586,730,761 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම පිරිවැටුම රු. 20,681,696,557 ක් වූයෙන් බද්දට යටත් පිරිවැටුම රු. 94,965,796 ක වෙනසක් විය. කෙසේ වුවද ඒ සඳහා සැසඳීම් ප්‍රකාශය පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුකළ අගය මත බදු පාලන ගිණුමේ ශේෂය රු.100,761,116 ක් වුවද බදු උපලේඛන අනුව රු. 113,182,122 ක් වූයෙන් වෙනස රු.12,421,006 ක් විය.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) රාජ්‍ය සමාගමක් විසින් ප්‍රමාද වී ගෙවන ලද රු. 6,779,212 ක විදුලි සංදේශ සංවර්ධන ගාස්තු සඳහා ගෙවිය යුතු රු. 813,505 ක අධිභාර 2018 ජූලි 16 දින වන විටත් ගෙවා නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සන්නිවේදන ක්‍රියාකරුවකුගෙන් මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු ලෙස රු. 7,621,129 ක් අයකර නොතිබුණි.

(ඇ) කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණ භාවිතා කරනු ලබන රාජ්‍ය අංශයේ ක්‍රියාකරුවන් 4 දෙනෙකුගෙන් හා පෞද්ගලික අංශයේ එක් ක්‍රියාකරුවෙකුගෙන් 2012

වර්ෂයේ සිට අයවිය යුතු වාරික මුදල් ගණනය කර අයකර ගැනීමට කටයුතු කර නොතිබුණ අතර එම ක්‍රියාකරුවන් සමඟ ගිවිසුම්වලටද එළඹී නොතිබුණි.

ඊට අමතරව 2012 ජනවාරි සිට 2017 දෙසැම්බර් 31 දින දක්වා තවත් ආයතන 04 කින් රු.93,846,873 ක විදුලි බිල්පත් ගාස්තු කොකාවිල් ඇන්ටනා හා ට්‍රාන්ස්මිෂන් කුළුණ භාවිතා කරනු ලබන ක්‍රියාකරුවන්ගෙන් 2018 ජූලි 16 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු. 3,604,038,706 ක් වූ ණයගැති ශේෂයෙන් රු. 371,451,570 ක් වර්ෂ 02 කට වැඩි ණය ශේෂ වූ අතර ඒ තුළ වසර 09 සිට වසර 26 දක්වා වූ රු. මිලියන 01 ට වැඩි ණයගැති ශේෂය රු. 197,130,954 ක් විය.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය සහ 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී කොමිෂන් සභාව විසින් රු.5,600,000,000 ක මුදලක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත හා 2016 අප්‍රේල් 29 දිනැති අංක 03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | උපයන විට ගෙවීම් මත බදු අදාල නිලධාරීන්ගේ වැටුපෙන් අයකර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවද, ඊට පටහැනිව පෙර වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද රු. 9,474,320 ක් උපයන විට බදු කොමිෂන් සභාවේ අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඇ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය | කොමිෂන් සභා අනුමැතිය මත කොමිෂන් සභාවේ නිලධාරීන් හා සේවකයින් බඳවා ගැනීම් සඳහා බඳවා ගැනීම් පරිපාටියක් සකස් කර එය භාවිතා කළද ඒ සඳහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| (ඈ) | 2005 ජනවාරි 27 දිනැති අංක PED/27 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඉ) | 2017 ජූනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සෑම රාජ්‍ය ආයතනයක්ම තම ආයතනය යටතේ වන සියළුම වත්කම් පිළිබඳ නිවැරදි තොරතුරු අදාල ආකෘතීන්ට අනුව කොම්ප්ට්රොලර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කල යුතු වුවද කොමිෂන් සභාව විසින් එසේ කර නොතිබුණි. |

## 2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 1 ඡේදයට අනුව රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ස්ථාපිත කිරීම සඳහා පනවනු ලබන පනත්වල කාර්ය මණ්ඩලයේ වැටුප් හා දීමනා නියම කිරීමට අදාලව විවිධ ප්‍රතිපාදන සලසා තිබුණද ඒ සඳහා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවද එම නිර්දේශ හා අනුමැතිය නොමැතිව කොමිෂන් සභා තීරණ මත හා අභ්‍යන්තර චක්‍රලේඛවලට අනුගත වෙමින් කාර්යමණ්ඩලය වෙත දිරි දීමනා, ප්‍රසාද දීමනා හා ගෙවල් කුලී දීමනා ලෙස සමාලෝචිත වර්ෂය තුළදී රු.73,661,558 ක් ගෙවා තිබුණි.

(ආ) 2007 ජුනි 01 දිනැති අංක එන්එස්සීසී/3/ඒබීසී/24 දරන ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලිපියෙන් මාණ්ඩලික නොවන කාර්ය මණ්ඩලය සඳහා රු. 2,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් අනුමත කර තිබුණද, රු. 6,000 බැගින් සමාලෝචිත වර්ෂයේ ද ගෙවා තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ කොමිෂන් සභාවේ බදු පසු ලාභය රු. 53,040,035,396 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පසු ලාභය රු. 54,613,961,089 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,573,925,693 ක අඩුවීමක් දක්නට ලැබුණි. බලපත්‍ර ගාස්තු ආදායම, විදුලි සංදේශ බදු ආදායම, විදුලි සංදේශ සංවර්ධන ගාස්තු ආදායම සහ පිටතට යන දේශීය ප්‍රවේශ ගාස්තු මත බදු ආදායම් (Levy on outgoing local access charges) රු. 1,655,910,100 කින් අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ දී රු. 46,937,880,323 ක් වූ අතිරික්තය 2017 වර්ෂය වන විට රු. 53,040,035,396 ක් දක්වා වර්ධනය වුවද එය 2016 වර්ෂයට සාපේක්ෂව රු. 1,573,925,693 ක අඩුවීමක් පෙන්නුම් කෙරුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමෙන් පසුව 2013 වර්ෂයේදී රු.47,643,341,372 ක් වූ දායකත්වය 2017 වර්ෂයේදී රු. 54,005,262,703 ක් වුවද එය 2016 වර්ෂයට සාපේක්ෂව රු. 1,728,987,321 කින් අඩු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

කොමිෂන් සභාවේ ආදායම හා වියදම පසුගිය වසර හා සැසඳීමේදී සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2017 දෙසැම්බර් 31 | 2016 දෙසැම්බර් 31 | වෙනස වැඩිවීම/ (අඩුවීම) | වෙනසේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | |
| මෙහෙයුම් ක්‍රියාකරු බලපත්‍ර ගාස්තු | 690,142,880 | 1,751,344,170 | (1,061,201,290) | (61) |
| සංඛ්‍යාත පූර්ව ගාස්තු | 4,509,183,673 | 367,346,939 | 4,141,836,734 | 1,127 |
| ස්ථාවර තැන්පතු පොළී ආදායම | 2,027,097,093 | 1,964,452,870 | 62,644,223 | 3 |
| නියාමන වියදම් | 66,857,614 | 164,191,324 | (97,333,710) | (59) |
| Levy on outgoing local access charges | 730,277,739 | 1,127,678,211 | (397,400,472) | (35) |
| මුළු ආදායම | 54,368,045,117 | 56,023,955,218 | (1,655,910,101) | (3) |
| මුළු වියදම | 791,573,908 | 682,234,096 | 109,339,812 | 16 |
| වර්ෂයේ බදු පෙර ලාභය | 53,576,471,208 | 55,341,721,121 | (1,765,249,913) | (3) |

(අ) සමාලෝචිත වර්ෂය තුළදී පෞද්ගලික ආයතන 05 කින් සංඛ්‍යාත පූර්ව ගාස්තු (Frequency Upfront fee) රු.4,509,183,673 ක් අයකර ගැනීම හේතුවෙන් 2017 වර්ෂයේ සංඛ්‍යාත පූර්ව ගාස්තු සියයට 1,127 කින් ඉහළ ගොස් තිබුණි.

(ආ) පසුගිය වසරට සාපේක්ෂව ආර්ථික සමාජ වගකීම් වියදම් රු. 100,750,000 කින් අඩුවීම හේතුවෙන් නියාමන වියදම් සියයට 59 කින් අඩුවී තිබුණි.

(ඇ) පසුගිය වසරට සාපේක්ෂව Levy on Outgoing local access Charges සියයට 35 කින් අඩුවී තිබූ අතර ස්මාර්ට් ෆෝන් (Smart Phone) භාවිතය හා ඕවර් ද ටොප් (Over –the -top) නොමිලේ භාවිතා කළ හැකි මොබයිල් ඇප්ලිකේෂන් භාවිතය සහ රජයේ බදු ප්‍රතිපත්තියේ වූ වෙනස්වීම් මේ සඳහා බලපා තිබුණි.

## 3.3 කොමිෂන් සභාවට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන 02 ක් විසින් පිළිවෙලින් සංඛ්‍යාත ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීම හා කොන්ත්‍රාත් ගිවිසුම කඩවීම මත එකතුව රු. 47,346,612,000 ක් වන්දි ඉල්ලා කොමිෂන් සභාවට එරෙහිව නඩු පවරා තිබුණි.

(ආ) හම්බන්තොට තොරතුරු තාක්ෂණ උද්‍යානයේ විදුලි සංදේශ මාධ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීමේ කොන්ත්‍රාත්කරු හා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අතර 2014 ජූලි 28 දින එළඹුණු කොන්ත්‍රාත් ගිවිසුම 2016 අගෝස්තු 10 වන දින අවසන් කර ඇති අතර කොන්ත්‍රාත්තුව අවසන් කිරීමේ විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ තීරණයට එරෙහිව කොන්ත්‍රාත්කරු විසින් ආරවුල් බේරුම්කාර මණ්ඩලය වෙත පැමිණිල්ලක් යොමු කර තිබුණි. බේරුම්කාර මණ්ඩලයේ තීරණය අනුව රු. 139,931,875 ක මුදලක් පැමිණිලිකරුට ගෙවන ලෙස කොමිෂන් සභාවට නියම කර තිබුණද කොමිෂන් සභාව විසින් 2017 දෙසැම්බර් 14 දින එම තීරණයට එරෙහිව වැඩිදුරටත් බේරුම්කරණය (Arbitration) සඳහා යොමු කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 4.1 කාර්යසාධනය

------------------

#### 4.1.1 සැලසුම් කිරීම

-----------------

කොමිෂන් සභාවේ කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වර්ෂ තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟා කර ගැනීමට හැකි වන පරිදි කටයුතු මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වේ. එහෙත් කොමිෂන් සභාවේ සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරි සැලැස්ම සකස් කර අනුමත කර තිබුණේ මූල්‍ය වර්ෂය අවසන් වී මාස 02 ක් ඉක්ම යාමෙන් පසු එනම් 2018 පෙබරවාරි 06 දින දීය.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

----------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂය තුළදී සිදුකළ යුතුව තිබූ එහෙත් 2017 වර්ෂය සඳහා කල් දමන ලද අන්තර්ජාල ළමා අරක්ෂණ වැඩසටහන, සංඛ්‍යාත කළමනාකරණ අංශය ස්වයංක්‍රීය කිරීමේ පද්ධතියක් සථාපිත කිරීම හා විදුලි සංදේශ ක්ෂේත්‍රයේ පර්යේෂණ සිදු කිරීම යන කාර්යයන් 2017 වර්ෂය තුළදී ද සිදුකර නොතිබුණි.

(ආ) 2016 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ සංඛ්‍යාත නිරීක්ෂණ පද්ධතිය ස්වයංක්‍රීය කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දීම 2017 වර්ෂය දක්වා කල්දමා තිබුණද එය සිදුකර නොතිබුණි. එම පද්ධතිය ක්‍රියාකරවීම, භාවිතා කිරීම සහ නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් තාක්ෂණික නිලධාරීන් නොමැති වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මේ සඳහා ප්‍රතිපාදන ලබා නොගත් බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දන්වා තිබුණි.

(ඇ) ජංගම දුරකථන භාවිතා කරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම උදෙසා කොමිෂන් සභාව විසින් අසාදු ලේඛන ගත ජංගම දුරකථන පිළිබඳ විස්තර ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවන් අතර හුවමාරු කරගැනීමට හැකිවන පරිදි එකී ජාල ක්‍රියාකරුවන්ගේ භාවිතය පිණිස “ජාතික උපකරණ හඳුනාගැනීමේ ලේඛනය” (National Equipment Identity Register) සකස් කිරීම සඳහා 2014 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමිව තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් අදාල කාර්යය සිදුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 22 (උ) වගන්තිය යටතේ වූ නියමය පරිදි සහ 2010 දෙසැම්බර් 27 දිනැති අංක 1686/4 දරන ශ්‍රී ලංකා සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් නිවේදනය අනුව ඊලඟ මාසයේ 15 වෙනි දිනට පෙර සෙස් ගාස්තු ගෙවිය යුතු වුවත් එක් විදුලි සංදේශ ක්‍රියාකරුවෙකු 2016 හා 2017 වර්ෂ සඳහාත් තවත් ක්‍රියාකරුවෙකු 2017 වර්ෂය සඳහාත් සෙස් ගාස්තු ගෙවා නොතිබුණ අතර එක් ආයතනයක් ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා ගෙවීම් කර තිබුණේ 2018 මාර්තු 15 දිනදීය. සෙස් ගාස්තු නොගෙවීම හෝ ප්‍රමාද වී ගෙවීම් කරන ක්‍රියාකරුවන්ගෙන් දඩ මුදලක් අයකර ගැනීම සඳහා නීතිමය බලය ලබා ගැනීමට හැකි වනු පිණිස විදුලි සංදේශ පනතට වගන්ති ඇතුලත් කිරීමේ අවශ්‍යතාවය වරින් වර විගණන වාර්තා තුලින් පෙන්වා දුන්න ද මේ වනතෙක් එය සංශෝධනය කර නොතිබුණි. තවද විදුලි සංදේශ බදු පනත සංශෝධනය නොකිරීම හේතුවෙන් විදුලි සංදේශ සංගමයේ ප්‍රවීනයන්ගේ සහයෝගීතා වැඩසටහන යටතේ ඉදිරිපත් කර ඇති වාර්තාව ක්‍රියාත්මක කිරීමටද නොහැකි වී තිබුණි.

(ආ) 2011 අංක 21 දරන විදුලි සංදේශ බදු පනතට අනුව විදුලි සංදේශ බදු ඊලඟ මාසයේ 15 දිනට පෙර ගෙවිය යුතු වුවත් ක්‍රියාකරුවන් තිදෙනෙකුගෙන් නියමිත පරිදි බදු සහ අධිභාර අයකර ගෙන නොතිබුණ අතර එසේ අය විය යුතු කාල පරාසය මාස 05 සිට වසර 03 දක්වා විය.

(ඇ) කොමිෂන් සභාවට අයත් අක්කර 112 රූඩ් 01 පර්චස් 10.5 ප්‍රමාණයකින් යුත් ඉඩමකින් ආසන්න වශයෙන් සියයට 50 ක ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භුක්ති විඳිමින් පවතින අතර ඒ සම්බන්ධයෙන් කළමනාකරණය විසින් සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්**

**----------------------------**

ඩිජිටල් භූමිෂ්ඨ විකාශන ජාල ව්‍යාපෘතිය (Digital Terrestrial Broadcasting Network Project) ක්‍රියාත්මක කිරීම සඳහා 2014 වර්ෂයේ දී විදේශීය සමාගමක් සමඟ ගිවිසුම් ගත වී තිබුණද 2018 ජූලි 16 දින වන තෙක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොකිරීමට හේතු ලෙස ව්‍යාපෘතියට සම්බන්ධව කොමිෂන් සභාවට නෛතිකව වගකීම පැවරෙන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී නොමැති බවටත් ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආයතනය (DBNO) මෙතෙක් පිහිටුවා නොමැති බවටත් අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

**-------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.8 වගන්තිය අනුව පරිත්‍යාග කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතු වුවත් එම අනුමැතිය ලබාගැනීමකින් තොරව ශ්‍රී ලංකා පරිපාලන සේවා සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීමක් සඳහා සහ ජයවර්ධනපුර කෝට්ටේ රජ මහා විහාරයේ ශ්‍රී දළදා පෙරහැර වෙනුවෙන් පිළිවෙළින් රු. 300,000 ක් හා රු. 500,000 ක් ගෙවා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ අරමුණුගත කාර්යයක් නොවන චිත්‍රපටයක් හා ටෙලි නාට්‍යයක් නිෂ්පාදනය කිරීම වෙනුවෙන් පිළිවෙළින් රු. 32,192,177 ක හා රු.7,160,400 ක මුදලක් කොමිෂන් සභා අනුමැතිය මත නිෂ්පාදන හා අධ්‍යක්ෂ වෙත 2015 වර්ෂයේදී ගෙවා තිබුණු අතර චිත්‍රපටය වෙනුවෙන් වැයකරන ලද මුදලින් රු. 26,400,000 ක් චිත්‍රපට අධ්‍යක්ෂවරයා විසින් 2018 ජනවාරි 12 දින වන විට ආපසු ගෙවා තිබුණි. විගණිත දිනය වූ 2018 ජූලි 16 දින වන විටත් ටෙලිනාට්‍ය විකාශනය කර නොතිබුණ අතර මුල් පිටපත කොමිෂන් සභාව විසින් ආපසු භාරගෙන තිබුණි. කෙසේ වුවද චිත්‍රපටය හා ටෙලිනාට්‍ය වෙනුවෙන් පිළිවෙළින් රු.5,792,177 ක් රු.7,160,400 ක් අයකර ගත යුතුව තිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් කුලියට ලබා ගන්නා ලද ලොන්ඩන් පෙදෙසේ පිහිටි ගොඩනැගිල්ලක් 2015 වර්ෂයේ ආපසු භාරදී තිබුණද එහි තැන්පත් මුදල වන රු. 1,350,000 ක් 2018 ජූලි 16 දින වන විටත් ආපසු ලබාගෙන නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේ කොමිෂන් සභා නිලධාරීන්ගේ පවුල් සුහද හමුව වෙනුවෙන් කොමිෂන් සභා අරමුදලින් වැයකර තිබූ මුදල රු. 7,999,125 ක් විය.

**4.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 299 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 206 ක් විය. මෙහිදී පුරප්පාඩු සංඛ්‍යාව 98 ක් හා අතිරික්ත සංඛ්‍යාව 05 ක් විය. 2018 ජූනි 01 දින වන විට අත්‍යාවශ්‍ය බඳවා ගැනීම් සිදුකර ඇති බවත්

අනුමත කාර්ය මණ්ඩලය, ආයතනික ව්‍යුහය හා බඳවා ගැනීමේ රීති කාණ්ඩයෙහි සිදුකල යුතු වෙනස්කම් සිදුකරමින් පවතින බවත් අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණද එම කටයුතු 2018 ජූලි 16 දින වන විටත් නිමකර නොතිබුණි.

(ආ) අනුමත කාර්ය මණ්ඩලයට ඇතුලත් නොවූ සහකාර ගණකාධිකාරී තනතුරු 02 ක් ස්ථිර පදනමින් හා එක් ව්‍යාපෘති උපදේශක තනතුරක් කොන්ත්‍රාත් පදනමින් බඳවා ගෙන තිබුණි.

(ඇ) ව්‍යාපෘති සහායක තනතුරට අදාලව සුදුසුකම් සපුරා ඇති පුද්ගලයෙකු සඳහා තත්කාර්ය පදනම ව්‍යාපෘති උපදේශක තනතුරක් ලබාදී 2017 ඔක්තෝබර් 09 වන දින සිට වසරක කාලයක් සඳහා මාසයකට රු.114,400 ක වැටුපක් හා රු.22,000 ක ඉන්ධන දීමනාවක් ලබාදී තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

-----------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

-----------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයක් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

(ආ) තිරසාර සංවර්ධන අරමුණු පාදක කර ගනිමින් විදුලි සංදේශ තොරතුරු තාක්ෂණ ප්‍රවර්ධනය සඳහා 2030 වන විට සෑම ග්‍රාමීය ප්‍රදේශයක් තුළම විදුලි සංදේශ කටයුතු ආවරණය කිරීමේ ඉලක්කය කරා ලඟා වීමේදී අදාල කාර්යයන් නියාමනය කිරීම සඳහා අවශ්‍ය වන සංඛිස්ථානයන් හඳුනාගෙන නොතිබුණි.

(ඇ) 2016 හා 2017 වර්ෂවලදී තිරසර සංවර්ධන ඉලක්ක කරා ලගා වීම සඳහා අවශ්‍ය තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පදනම් කරගෙන මූල්‍ය ප්‍රතිපාදන හඳුනාගෙන නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------------

### 6.1 වාර්ෂික වාර්තා සභාගත කිරීම

-----------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව 2015 හා 2016 වර්ෂවල වාර්ෂික වාර්තා 2018 ජූලි 16 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 6.2 අයවැය පාලනය

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 8 (1) වගන්තියට අනුව කෙටුම්පත් අයවැය ලේඛනය ගිණුම් වර්ෂය ආරම්භ වීමට මාස 03 කට පෙර අනුමත කළ යුතු වුවත් එය අනුමත කර තිබුණේ 2017 පෙබරවාරි 14 දින දීය.

(ආ) අයවැය ලේඛනයේ අයවැයගත හා තථ්‍ය අගයන් අතර සියයට 11 සිට සියයට 79 දක්වා විචලනයන් නිරීක්ෂණය විය. තවද වටිනාකම රු. මිලියන 53.5 ක් වූ වැය 09 ක් අයවැය ලේඛනයට ඇතුලත් කර නොතිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 6.3 නොවිසඳී ඇති විගණන ඡේද

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 ජූනි 23 දිනැති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නිකුත් කරන ලද අංක 9 නියෝගය අනුව ආයතනය ණයක් ලබා නොගෙන ආයතනයේ මුදල්වලින් මෙම ඉදිකිරීම සිදු කළේ නම් ලැබෙන ලාභය යනාදී කරුණු ඇතුළත් වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාව වෙත එවීමට නියෝග කළද එය 2018 ජූලි 16 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2016 ජූනි 23 දින පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නෙළුම් කුළුණ ඉදිකිරීම සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදු කළ යුතු බව අවධාරණය කළද 2018 ජූලි 16 දින වන විටත් එය සිදුකර නොතිබුණි.

## 6.4 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

### 6.4.1 ප්‍රසම්පාදනයන්

------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන සැලැස්ම පරික්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

(i) වර්ෂය ආරම්භ වීමට ප්‍රථම ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර අනුමත කළ යුතු වුවත් 2017 වර්ෂය සඳහා සකස් කර තිබූ ප්‍රසම්පාදන සැලස්ම අනුමත කර තිබුණේ මූල්‍ය වර්ෂය ආරම්භ වී මාස 11 ක් ගතවීමෙන් පසු 2017 නොවැම්බර් 28 දින දීය.

(ii) පරික්ෂාවට භාජනය වූ ප්‍රසම්පාදන අතරින් රු.50,769,759 ක් වටිනා ප්‍රසම්පාදන කටයුතු දෙකක් මෙම ප්‍රසම්පාදන සැලැස්මට ඇතුලත් කර නොතිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 4.2.3 අනුව ප්‍රසම්පාදන කාලසටහනක් සකස් කර ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) සම්මත ලංසු ලේඛනයට (Standard Bid Document) අනුව වැට්බදු පමණක් වෙනමම පෙන්විය යුතු අතර අනෙකුත් බදු හා ගාස්තු ලංසු මිලටම එකතුකර පෙන්විය යුතුය. මෙම උපදේශය ලංසු කැඳවීමේ ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2016/2017 මයික්‍රොසොෆ්ට් ඔෆිස් 365 බලපත්‍රය ලබාගැනීමට තරගකාරී මිලගණන් කැඳවා තිබුණ අතර ආයතන 05 ක් ලංසු ඉදිරිපත් කර තිබුණි. මෙහිදී සියළු අවශ්‍යතා සපුරා ඇති බව නිර්දේශ කර වැට් සහිත රු. 4,866,988 ක තෙවැනි මිල සහිත ලංසුව ඉදිරිපත් කළ ආයතනය වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2017 සැප්තැම්බර් 15 දින තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් ඇගයීම් සිදුකර ආයතනයක් නිර්දේශ කර තිබියදී එම ආයතනය කොන්දේසිවලට පටහැනිව මෙම ප්‍රසම්පාදනය ඉදිරිපත් කර ඇති බවට හේතු ඉදිරිපත් කරමින් 2017 සැප්තැම්බර් 20 දින එම නිර්දේශය ප්‍රතික්ෂේප කර ඉතිරි ලංසුකරුවන්ගෙන් සුදුසු අයෙක් තෝරා

ඉදිරිපත් කරන ලෙසට ප්‍රසම්පාදන කමිටුව විසින් නැවත තාක්ෂණික ඇගයීම් කමිටුවට දන්වා තිබීම විගණනයේදී ගැටළුකාරී විය.

(ii) ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 7.8.4 වගන්තිය පරිදි ලංසු කොන්දේසි අනුව ප්‍රමාණවත් ලංසු සුරක්ෂණයක් ලබානොදීම හා ඉල්ලා තිබූ පලපුරුද්ද නොමැති වීම විශාල විශාල බැහැරවීම් ලෙස සලකා විස්තරාත්මක ඇගයීම් සිදු නොකරම ලංසුව ප්‍රතික්ෂේප කළයුතු වුවත් එම ආයතනය ජයග්‍රාහී ලංසුකරු ලෙස තෝරාගෙන 2017 සැප්තැම්බර් 28 දින ප්‍රසම්පාදන කාර්යය පිරිනමා තිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ 2017/2018 වර්ෂය සඳහා සේවක ජීවිත හා වෛද්‍ය රක්ෂණ සහ දේපල, පිරියත හා උපකරණ සඳහා සාමාන්‍ය රක්ෂණාවරණය ලබා ගැනීමට 2017 අගෝස්තු 14 දින රජයේ රක්ෂණ ආයතන 03 කින් මිල ගණන් කැඳවා තිබුණ අතර ආයතන 02 කින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණි. මෙහිදී රු. 49,663,655 කට අවම ලංසුව ඉදිරිපත් කල ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ආයතනය තෝරාගෙන තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ලංසු කොන්දේසිවලට අනුව ලංසු කැඳවීමේ ක්‍රියාවලියට සහභාගිවන සියළුම ලංසුකරුවන් විසින් ලංසු සුරක්ෂණයක් ඉදිරිපත් කල යුතු වුවත් ප්‍රසම්පාදන ප්‍රදානය කරන ලද ආයතනය එවැනි සුරක්ෂණයක් ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ලංසු ලේඛනවල කොන්දේසිවලට අනුව ලංසු වටිනාකමින් සියයට 10 ක කාර්යසාධන බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතු වුවත් එය ඉදිරිපත් කර නොතිබුණි.

**6.4.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

---

**නෙළුම් කුළුණ ව්‍යාපෘතිය**

---

2010 ඔක්තෝබර් 29 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි නෙළුම් කුළුණ ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව චීන සමාගම් 02 ක් වෙත ප්‍රදානය කර තිබුණ අතර කොමිෂන් සභාව විසින් 2012 ජනවාරි 03 දින වටිනාකම එ.ජ.ඩො 104,300,000 ක්වූ කොන්ත්‍රාත් ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුමට අනුව 2012 නොවැම්බර් 12 සිට 2015 මැයි 12 දින දක්වා දින 912 කින් මෙම කොන්ත්‍රාත්තුව නිම කළ යුතුව පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ණය මුදල සඳහා එකඟතා ගාස්තු ගෙවීම

---

(i) චීනයේ පෞද්ගලික බැංකුවක් වූ EXIM බැංකුව විසින් පළමු ණය මුදල 2013 අගෝස්තු 19 දින නිදහස් (Disbursement) කර තිබූ අතර 2016 අගෝස්තු 18 දින වන විට ඇ.එ.ජ.ඩොලර් 88,655,000 ක්වූ මුළු ණය මුදලම ණය නිදහස් කිරීමේ කාලය අවසන් වීමට නියමිතව තිබුණි. එහෙත් ඉදිකිරීම් ප්‍රගතිය පහළ මට්ටමක පැවතීම හේතුවෙන් එම දින වන විට සම්පූර්ණ ණය මුදලින් එ.ජ.ඩො. 43,746,097 ක් පමණක් එනම් සියයට 49 ක් නිදහස් කරගෙන තිබුණි. ඒ අනුව ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් නියමිත දිනට සිදු නොකිරීම නිසා 2016 අගෝස්තු 19 දින සිට 2017 ඔක්තෝබර් 27 දක්වා කාලය සඳහා පමණක් උපයෝජනයට නොගත් ණය මුදල සඳහා ගෙවීමට සිදුවූ අමතර එකඟතා ගාස්තු ප්‍රමාණය එ.ජ.ඩො. 322,984 ක් විය.

(ii) ණය ගිවිසුමෙහි කාල සීමාව ඉක්මවීම මත EXIM බැංකුව විසින් නිදහස් කරනු ලබන සම්පූර්ණ ණය මුදල එ.ජ.ඩො. 67,259,754 කට සීමා කර තිබුණද ආරම්භයේ සිටම එකඟතා ගාස්තු ගණනය කිරීමේදී සම්පූර්ණ ණය මුදලම යොදා ගැනීම හේතුවෙන් එ.ජ.ඩො. 636,508 ක එකඟතා ගාස්තු ප්‍රමාණයක් වැඩියෙන් ගෙවා තිබුණි.

(ආ) ඉඩමේ අයිතිය පවරා ගැනීම

--------------------------------

(i) 2011 දෙසැම්බර් 14 දිනැති අංක අමප/11/2262/501/026/ටීබීආර් දරන අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ආයතනය විසින් ඉඩම පවරා ගැනීම සඳහා කටයුතු කර තිබුණද නාගරික සංවර්ධන අධිකාරිය මගින් කොමිෂන් සභාව වෙත ඉඩම පවරා දී නොතිබුණි.

(ii) අමාත්‍ය මණ්ඩල තීරණයට සමගාමී නොවී විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2012 ජනවාරි 23 දින ඇතිකරගෙන තිබුණු අවබෝධතා ගිවිසුමෙහි 03 වගන්තිය අනුව තැපැල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා වරාය අධිකාරිය සහ දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් ඉඩම්වල පූර්ව අයිතිය මාස 06 ක් ඇතුළත ලබාගැනීමටත් වසරක් ඇතුළත එම ඉඩම් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට පැවරීමටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් කඩිනම් පියවර ගත යුතු බව සඳහන් වුවද 2018 ජූලි 16 වන තෙක් එසේ කටයුතු කර නොතිබුණි.

(ඇ) ඉදිකිරීමේ ප්‍රමාදය

---------------------

(i) නෙළුම් කුළුණ ඉදිකිරීමෙහි කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසු 2015 අගෝස්තු 28 දිනැති අංක 2K15.217.02(2) දරන කොමිෂන් සභා තීරණය අනුව කොන්ත්‍රාත් කාලය 2017 ඔක්තෝබර් දක්වා දීර්ඝ කිරීමට අනුමැතිය ලබා දී තිබුණද 2018 ජූලි 31 දින වන විටත් ඉදිකිරීම් අවසන් කර නොතිබුණි.

(ii) කොන්ත්‍රාත් ගිවිසුමෙහි 8.7 උප වගන්තියට අනුව දිනක ප්‍රමාද ගාස්තුව මූලික ගිවිසුම් මුදලින් සියයට 0.05 ක් හා උපරිම ප්‍රමාද ගාස්තුව කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 10 ක් විය. ඒ අනුව ප්‍රමාද ගාස්තු අයකළ හැකිව තිබුණේ දින 200 ක් සඳහා පමණි.

(ඇ) විදුලි සෝපාන සහ විදුලි තරප්පු පෙල සවිකිරීම

---------------------------------------------------

(i) විදුලි සෝපාන හා විදුලි තරප්පු සඳහා ව්‍යාපෘති උපදේශන ඒකකය විසින් 2014 සැප්තැම්බර් 19 හා 2014 ඔක්තෝබර් 17 දිනැති ලිපි මගින් 'OTIS' සහ 'KOYO' සන්නම් නාම නිර්දේශ කර තිබියදී 2014 දෙසැම්බර් 11 දිනැති ව්‍යාපෘති උපදේශන කමිටු වාර්තාව මගින් විදුලි සෝපාන L4 සහ L8 හැර ඉතිරි සෝපාන සහ විදුලි තරප්පු සඳහා 'Fujitec' සන්නම් නාමය නිර්දේශ කිරීම සඳහා හේතුව විගණනයට අනාවරණය නොවීය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට එකඟවීමක් හෝ නොවීමක් ප්‍රකාශ කළ නොහැකි බව ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් විසින් දන්වා තිබුණි.

(ii) එසේ වුවද විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව විසින් L4 හා L8 ඇතුළුව විදුලි සෝපාන 8 ක් හා විදුලි තරප්පු 8 ක් සැකසීමේ කාර්යය Fujitec වෙත ලබාදීමට කොමිෂන් සභාව විසින් 2016 මාර්තු 29 දින අනුමැතිය ලබා දී තිබුණද ඒ සඳහා ව්‍යාපෘති උපදේශන ඒකකයේ නිර්දේශයක් ලබා ගෙන නොතිබුණි.

(iii) මෙහිදී ජනාධිපති උපදේශකවරු දෙදෙනෙකුගෙන් කැඳවන ලද යෝජනා සහ නෙළුම් කුළුණෙහි විදුලි සෝපාන සහ විදුලි තරප්පු පෙල සවිකිරීම සඳහා උපකොන්ත්‍රාත්කරුවකු තෝරා ගැනීම සම්බන්ධයෙන් පේරාදෙනිය විශ්ව විද්‍යාලයේ නිර්මාණ මධ්‍යස්ථානය වෙතින් රු. 1,000,000 ක් වැයකර කැඳවන ලද වාර්තාවෙහි ඇතුළත් කරුණු පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි.

(iv) 2013 අගෝස්තු මාසයේදී ආරම්භ කරන ලද විදුලි සෝපාන සහ විදුලි තරප්පු සඳහා උප කොන්ත්‍රාත්කරුවකු තෝරාගැනීමේ ප්‍රසම්පාදනය සඳහා වසර 2 මාස 8 ක් දීර්ඝ කාලයක් ගත කිරීමෙන් අනතුරුව 2016 මාර්තු 31 දින කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණ අතර මෙම ප්‍රසම්පාදනයේ ප්‍රමාදය මූලිකවම නෙළුම් කුළුණ ව්‍යාපෘතිය ඉදිකිරීමේ ප්‍රමාදය සඳහා හේතු වී තිබුණි.

(v) විදුලි සෝපාන 06 ක් සහ විදුලි තරප්පුපෙලවල් 08 ක් සවිකිරීම 2017 අප්‍රේල් 30 ට පෙර අවසන් කළ යුතු වුවත් 2017 ජූනි 28 දින වන විට එම උපකරණ පමණක් වැඩබිම වෙත සපයා තිබුණි. සියළුම විදුලි සෝපාන සහ විදුලි තරප්පුපෙලවල් සවිකිරීම සහ ක්‍රියාත්මක කිරීම 2017 සැප්තැම්බර් 30 දින වන විට අවසන් කළ යුතු වුවත් 2018 මැයි 11 දින වන විටත් එය අවසන් කර නොතිබුණි.

(ඉ) උපදේශන ගාස්තු ගෙවීම
-----------------------------

2010 ඔක්තෝබර් 27 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව ඉදිරිපත් කරනලද කොමිෂන් සභා පත්‍රිකා අංක DC/1994 සඳහා අංක 2K13.DC.199H හා 2013 පෙබරවාරි 06 දිනැති කොමිෂන් සභා තීරණයට අනුව උපදේශන සේවා ලබාගැනීම සඳහා අනුමැතිය හිමිවී තිබුණි. ඒ අනුව 2013 පෙබරවාරි 15 දින ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව හා මොරටුව විශ්වවිද්‍යාලය අතර උපදේශන සේවා ලබාගැනීම සඳහා ගිවිසුම් අත්සන් කර තිබුණ අතර උපදේශන ගාස්තු ලෙස කොන්ත්‍රාත් මුදලින් සියයට 1.5 ක් එනම් රු. 198,691,500 ක් ගෙවීමට එකඟවී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මෙම උපදේශන ගාස්තු ගෙවීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ii) උක්ත ගිවිසුමට පටහැනිව 2015 නොවැම්බර් සිට මාසයකට රු. මිලියන 03 බැගින් අමතර උපදේශන ගාස්තු ගෙවීමක් සිදු කිරීමට එකඟ වී තිබුණි. 2018 අප්‍රේල් වන විට උපදේශන ගාස්තු ලෙස රු. මිලියන 240 ක් මොරටුව විශ්වවිද්‍යාලයට ගෙවා තිබුණි.

(ඊ) නෙළුම් කුළුණ ව්‍යාපෘතිය සම්බන්ධයෙන් බදු ගෙවීම
-------------------------------------------------------------

(i) නීතිපති දෙපාර්තමේන්තුවේ 2011 සැප්තැම්බර් 08 දිනැති නීතිපතිගේ, සභාවේ අධ්‍යක්ෂ ජනරාල් ඇමතූ ලිපිය අනුව බදු ගෙවීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරුවන් සහ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ වගකීම කොන්ත්‍රාත් ගිවිසුමෙහි නිවැරදිව හඳුනාගැනීම සිදුකළ යුතු බව දන්වා තිබුණද එලෙස හඳුනාගැනීමකින් තොරව කොන්ත්‍රාත් ගිවිසුමෙහි 23.2 වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළදී අයකරනු ලබන සියළු බදු, ගාස්තු හා වෙනත් ගාස්තුවලින් කොන්ත්‍රාත්කරු නිදහස් බවටත් 23.3 වගන්තිය අනුව කොන්ත්‍රාත්තුව ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සියළුම බදු, ගාස්තු හා වෙනත් ගාස්තු සඳහා ශ්‍රී ලංකාවේ නීති, රෙගුලාසි අනුව විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වගකිව යුතු බවට දක්වා තිබුණි.

මේ සම්බන්ධයෙන් එකඟවීමක් හෝ නොවීමක් මෙම අවස්ථාවේ ප්‍රකාශ කළ නොහැකි බවත් අදාල වගන්තිවල පවතින නීතිමය ස්වභාවය සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් උපදේශන සහාය ලබාගනිමින් සිටින බවත් කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් විගණනය වෙත දන්වා තිබුණි.

(ii) කොන්ත්‍රාත් වටිනාකම වූ එ.ජ.ඩො. 104,300,000 ඇතුලත ගෙවීම් සිදුකළ යුතු වුවත් ඊට අමතරව උක්ත වගන්ති ප්‍රකාර කොන්ත්‍රාත්කරු විසින් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ගෙවන ලද ආදායම් බදු රු. 87,394,566 ක් හා උපයන විට ගෙවීම් බදු රු. 11,175,734 ක් කොමිෂන් සභාව මගින් අයකරගැනීම සඳහා කොන්ත්‍රාත්කරු හිමිකම් ඉල්ලා තිබුණ ද මෙසේ බදු ගෙවීමට දේශීය මුදල් ප්‍රතිපාදන ලබාගෙන නොතිබුණි.

(ඞ) නෙළුම් කුළුණ ඉදිකිරීම නිම කිරීමෙන් පසු ක්‍රියාවලිය

---

(i) 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත හා 1996 අංක 27 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ (සංශෝධන) පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට සමාගමක් ස්ථාපනය කිරීම සඳහා බලතල නොතිබීම නිසා 2010 ඔක්තෝබර් 27 දිනැති අංක 10/2473/401/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් පහත සඳහන් යෝජනා ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී තිබුණද ඒවා ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

- යෝජිත රූපවාහිනී කුළුණ සහ විනෝදාස්වාද මධ්‍යස්ථානය, කළමනාකරණ උපදේශන සමාගමක් වෙත සාකච්ඡා කර පැවරීම.

- ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ හිමිකාරීත්වය යටතේ කොළඹ රූපවාහිනී කුළුණ සහ විනෝදාස්වාද මධ්‍යස්ථානය, ප්‍රසිද්ධ සමාගමක් ලෙස පිහිටුවීම, කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කිරීම සහ ආරම්භක මහජන නිකුතුවක් මගින් සියයට 30 ක කොටස් ප්‍රාග්ධනයක් නිකුත් කිරීම.

(ii) විදුලි සංදේශ පනතට අනුව සමාගමක් පිහිටුවීමට බලතල නොතිබීම නිසා කොළඹ නෙළුම් කුළුණ දේපළ කළමනාකරණ සමාගමකට බදු දීම ක්‍රියාත්මක කර තිබුණද ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2018 ජූලි 16 දින වන විටත් ලබාගෙන නොතිබුණි.

(ඟ) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ අරමුදල් මගින් යොදවන රු. බිලියන 4 ක් නොඉක්මවන මුළු ආයෝජනයක් මත ඉදිකිරීමට යෝජිත රථගාල් සංකීර්ණය ඉදිකිරීම සඳහා 2018 ජූලි 16 දින වන විටත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය හා ඉඩමේ හිමිකාරීත්වය ලබාගෙන නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

---

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) අයවැය පාලනය | අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබීම. |
| (ආ) ණය පාලනය | දීර්ඝ කාලීනව නිරවුල් නොකළ ණය ශේෂ පැවතීම හා ණය අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතීම. |

| | | |
|---|---|---|
| (ඇ) | ආදායම් පාලනය | ආදායම් එකතු කර ගැනීම සඳහා ප්‍රමාණවත් නීති ප්‍රතිපාදන අනුමත කරගෙන නොතිබීම. |
| (ඈ) | දීමනා ගෙවීම් | අනුමැතියකින් තොරව කොමිෂන් සභා තීරණ මත දිරි දීමනා, ප්‍රසාද දීමනා හා නිවාස කුලී දීමනා ගෙවීම. |
| (ඉ) | කොන්ත්‍රාත් පාලනය | නෙළුම් කුළුණ ඉදිකිරීම් කටයුතු ප්‍රමාද වීම. |